# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය දරන තනතුරක් වන අතර, ස්ථාන මාරු වීම් රහිත වේ.

## ඖෂධ ඇගයීම් නිලධාරී තනතුර - (Pharmaceutical Assessor)

ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍ර ප්‍රාථමික ඇගයීමකින් පසු යෝග්‍ය ඇගයීම් ක්‍රමවේදය තීරණය කිරීම. / චිකිත්සක භාණ්ඩ (ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන) වල විද්‍යාත්මක ඇගයීම සහ ලියාපදිංචිය සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම. / චිකිත්සක භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන යහපත් නිෂ්පාදන පිළිවෙත්වලට (GMP) අනුකූලදැයි පරීක්ෂා කර වාර්තා සැකසීම සහ එම සමාගම් ලියාපදිංචිය සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබාදීම / ලියාපදිංචි කරන ලද චිකිත්සක භාණ්ඩ වල ප්‍රමිතිය පිළිබඳ පසු විපරම් කිරීම හා නියැදි රසායනාගාර තත්ත්ව පරීක්ෂාවන් සඳහා යොමු කිරීම / චිකිත්සක භාණ්ඩ වලට අදාළ අතුරු ආබාධ (Adverse Reactions) හා අනෙකුත් ගැටලු පිළිබඳව සුපරීක්ෂණය කිරීම / නිසි තත්ත්වයට නොමැති බවට තහවුරු වූ චිකිත්සක භාණ්ඩ භාවිතයෙන් ඉවත් කිරීම සඳහා කටයුතු කිරීම (Recall) / සායනික පර්යේෂණ (Clinical trials) නියාමනය කිරීම / අන්තරායකර ඖෂධ නියාමනය කිරීම, අදාළ තොරතුරු අන්තර්ජාතික අන්තරායකර ද්‍රව්‍ය පිළිබඳ පාලන සභාව (International Narcotic Control Board) වෙත ලබා දීම හා පෞද්ගලික අංශ සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණ නිර්දේශ කිරීම ඇතුළු අනෙකුත් ආනුෂාංගික කටයුතු සිදු කිරීම / චිකිත්සක භාණ්ඩ පිළිබඳ ප්‍රචාරණ කටයුතු නියාමනය කිරීම / සෞඛ්‍ය වෘත්තිකයන්, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම / දේශීය චිකිත්සක භාණ්ඩ නිෂ්පාදකයන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා අවශ්‍ය වන මුද්‍රහැරීමේ ලිපි සහ තීරු බදු සහනයන් සඳහා නිර්දේශයන් ලබා දීම / නීති කෙටුම්පත්, නියෝග ආදිය සකස් කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික නිරීක්ෂණ ලබාදීම සහ ඊට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම. (උදා : ඖෂධ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙගුලාසි, මිල රෙගුලාසි) / පනතේ විධිවිධාන පරිදි පිහිටුවා ඇති විශේෂඥ කමිටු වල පනත මගින් පත් කළ සාමාජිකයෙකු වීම සහ අනු කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම / තොග, සිල්ලර, ඖෂධ ශාලා සහ ඖෂධ ප්‍රවාහන බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම / ඖෂධ ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය සහ ඖෂධ ශාලා පවත්වාගෙන යාමේ යහපත් පරිචයන් පරීක්ෂා කිරීම, නියාමනය කිරීම හා වාර්තා සැකසීම / රාජකාරි සඳහා අවශ්‍ය වන සම්මත ක්‍රමවේදය (SOP) සහ උපදේශන මාලාව (Guide Lines) සැකසීම / 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ විධිවිධාන පරිදි බලයලත් නිලධාරියෙක් ලෙස ක්‍රියා කිරීම මෙම තනතුරට අයත් කාර්යභාරය වේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඖෂධවේදී (B pharm) / විද්‍යාවේදී ඖෂධවේදී (විශේෂ) BSc Sp. (pharmacy) උපාධිය

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

තනතුරට අදාළ වැටුප් පියවර

කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MM 1-1 රු. (53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු. 53,175/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :**

විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

**වෙනත් කරුණු**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.07.10 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ cv@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මගින් හෝ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ යුතුය. ඊ මේල් මගින් යොමු කිරීමේදී විෂය ලෙසද, තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ද අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## ................................... තනතුර සඳහා අයදුම්පත

01. සම්පූර්ණ නම :
02. මුලකුරු සමග නම :
03. ලිපිනය :
04. පදිංචි දිස්ත්‍රික්කය :
05. උපන් දිනය :
06. වයස : අවු : .................................. මාස : .................................. දින : ............................
07. ස්ත්‍රී / පුරුෂ භාවය :
08. ජාතික හැඳුනුම්පත් අංකය :
09. විභාගයට පෙනී සිටින මාධ්‍ය :
10. දුරකථන අංකය : ස්ථාවර : ...................................... ජංගම : ............................
11. විද්‍යුත් තැපැල :
12. අධ්‍යාපන සුදුසුකම් :
13. වෘත්තීය සුදුසුකම් :
14. පළපුරුද්ද :
15. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන් :

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

**දිනය :**

................................................................
**(ඉල්ලුම්කරුගේ අත්සන)**

**සැළකිය යුතුයි :**

අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර, ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු වේ.